**එම්.ඩබ්ලිව්.ඩී.විජේතිලක එ .ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව**

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/1658/19 (2020.02.11 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේදී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචන කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අධ්‍යක්ෂ-ජනරාල්** : ඩී.ජී.එම්.වී.හපුආරච්චි

**අභියාචක** - එම්.ඩබ්ලිව්.ඩී.විජේතිලක
**නොතිසි ලත් පාර්ශවය** - නම්කළ නිලධාරි - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව

**පෙනීසිටීම**
අභියාචක - පැමිණ ඇත
පොදු අධිකාරිය - පැමිණ නැත

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2019-04-30 |
| තොරතුරු නිළධරයා තීරණය ලබා දුන් දිනය | නැත. |
| නම් කල නිළධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2019-05-24 |
| නම් කල නිළධරයා තීරණය ලබා දුන් දිනය | නැත. |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2019-07-04 |

**අභියාචනයට පසුබිම්වූ කරුණු:**

අභියාචක 2019-04-30 දිනැති තොරතුරු ඉල්ලීම මගින් පහත තොරතුරු ඉල්ලා සිටින ලදී.

1. 2016.10.14 වන දින අභියාචක සංවිධානය මගින් දිස්ත්‍රික් කාර්යාලයට ඉදිරිපත් කළ නො/ගු/ප්‍ර/ජ/ස විවිධ (225) දරන ලිපිය ආවරණයෙන් වූ නිවාස 700කට ආසන්න අත්සන් ලේඛනය පාදක කොට ගෙන ප්‍රජා ජාල අභිමානී වැඩසටහනේ ප්‍රතිලාභ අභියාචක ගම් ප්‍රදේශවලට දිය හැකිද?

2. එම අත්සන් ලේඛනය සහිත ගොනුව දැනට කාර්යාලයේ තිබේද? එසේ නොමැති නම් වෙනත් ස්ථානයකට යොමු කළේද? ඒ කොතනටද? එසේ යොමු කළ බවට අභියාචක සංවිධානය වෙතටලිඛිතව දන්වූයේද?

3. නොමිලේ ලබා දුන් ක්ලෝරිනේටර් සඳහා ඉන්පසු මුදල් අයකර ගත යුතු බවට දෙපාර්තමේන්තුව නිකුත් කළ චක්‍ර ලේඛ, නියෝග හෝ දැන්වීමේ පිටපතක්

4. ක්ලොරිනටෝර් සඳහා අභියාචක සංවිධාන සභාපති 2018 දෙසැම්බර් මස රු..5000 ක මුදලක් ලබා දී ඇත්තේ නිල ලදුපතක් නොලැබුන අතර ක්ලොරිනටෝර්ද ලැබී නොමැත. සංවිධානය පත්ව ඇති අර්බුදය සමනය කර ගැනීම සඳහා රු.5000 ප්‍රජා ජාල සංවිධානය වෙත ලබා දී ක්ලොරිනේටර් ලැබුණු පසු නිල ලදුපතක් සහිතව සංවිධානය මගින් එම මුදල කාර්යාලයට ලබා ගැනීමේ ක්‍රමවේදයට අවතීර්ණ විය නොහැකිද?

5. 2013.04.02 වන දින පැවැත්වූ පැල්මඩුල්ල ප්‍රජා ජාල සංසදයේ 3 වන මහා සභාවේදී සංශෝධන සහිතව සම්මත වූ සන්සද ව්‍යවස්ථාවේ සහතික කල පිටපතක්

6. මාමුදැල්ල මාරපන මහා ජල ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද? ව්‍යාපෘතිය සඳහා පිහිටවූ සමිතියේ රැස්වීමක් 2017.05.12 වන දින මාරපන විදුහලේ පැවැත්වීමන් පසු කවර රැස්වීම් පවත්විද? අවසන් වතාවට නිලවරයක් පැවැත්වුයේ කවද්ද?

තොරතුරු නිලධාරියා පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019-05-24 දිනැතිව නම්කළ නිලධරයා වෙත අභියාචනයක් යොමු කරන ලදී. නම්කළ නිලධාරයා ද පනත ප්‍රකාරව නියමිත කාලය තුළ ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වූ බැවින් අභියාචක 2019-07-04 දිනැතිව කොමිෂන් සභාව වෙත අභියාචනයක් යොමු කරන ලදී.

**අභියාචනය සලකා බලන අවස්ථාවේදී උද්ගතවූ කාරණා:**

අභියාචක විසින් ප්‍රකාශ කර සිටියේ පොදු අධිකාරිය විසින් **2019-09-17** දිනැතිව කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක වෙත අභියාචකගේ **2019-04-30** දිනැති තොරතුරු ඉල්ලීමේ සඳහන් තොරතුරු අයිතම **1,2** සහ **6** සඳහා තොරතුරු දැනටමත් මුදා හැර ඇති බවත් තොරතුරු අයිතම **3,** සහ **4** වන අයිත්මයන්ට අදාල තොරතුරු අභියාචක හට ඉදිරියේදී පැවැත්වීමට නියමිත පැල්මඩුල්ල ප්‍රජා ජල සංසදය මහ සභාවේදී ලබා ගැනීමට හැකි බවය.
මෙහිදී කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ අභියාචකගේ තොරතුරු ඉල්ලීම සඳහා තොරතුරු නිලධාරියා හෝ නම්කළ නිලධාරියා විසින් පනතේ සඳහන් නිශ්චිත කාලසීමාවන් ප්‍රකාරව ප්‍රතිචාර යොමුකර නොමැති බවයි.

**එසේම පනතේ දක්වන නියමිත කාල පරාසයන් තුළ කටයුතු කිරීමට තොරතුරු නිලධාරියාට මෙන්ම නම්කළ නිලධාරියාටද තොරතුරු පනතේ 25(2) හා 31(3) වගන්ති ප්‍රකාරව ව්‍යවස්ථාපිත යුතුකමක් පවතින බවයි.**

කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටිනුයේ **2019-09-17** දිනැතිව පොදු අධිකාරිය විසින් අභියාචක වෙත යවන වාර්තාවෙන් අභියාචක ඉල්ලා සිටින ලද තොරතුරු අයිතම **1, 2** සහ **6** සඳහා තොරතුරු ආවරණය වන බවය**.**

**නියෝගය:**

තොරතුරු අයිතම **3,** සහ **4** වන අයිත්මයන්ට අදාල තොරතුරු අභියාචක හට ඉදිරියේදී පැවැත්වීමට නියමිත පැල්මඩුල්ල ප්‍රජා ජල සංසදය මහ සභාවේදී ලබා දෙන ලෙසටත් අභියාචකගේ **2019- 04-30** දිනැති තොරතුරු ඉල්ලීමෙහි සඳහන් තොරතුරු අයිතම **5** සඳහා පොදු අධිකාරිය විසින් කොමිෂන් සභාවට පිටපතක් සහිතව අභියාචක වෙත මෙම නියෝගය ලැබී මසක් ඇතුළත තොරතුරු මුදා හරින ලෙසට මින් නියෝග කරනු ලැබේ.

ඒ අනුව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යපටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

..............................................................
මහින්ද ගම්මම්පිල - සභාපති

..............................................................
කිශාලි පින්ටෝ ජයවර්ධන - කොමිෂන් සභා සාමාජිකා

..............................................................
එස්. ජී. පුංචිහේවා - කොමිෂන් සභා සාමාජික

..............................................................
රෝහිනී වල්ගම - කොමිෂන් සභා සාමාජික